
# හැඳින්වීම

ඩෙංගු රෝගය මේ වන විට සර්ම කලාපීය රටවල වඩාත් බහුලව සහ සීග්‍රයෙන් පැතිරීයන මදුරුවන් මඟින් බෝවන වෛරස රෝගයක් ලෙස හඳුනාගෙන ඇත. ඩෙංගු රෝගය ඇතිකරන වෛරසයේ ප්‍රභේද හතරක් ඇත.

මේ අනුව පුද්ගලයෙකුට ජීවිත කාලය තුලදී ඩෙංගු රෝගය කිහිප වතාවක් වැළඳීමට ඉඩකඩ තිබේ. එම නිසා, මෙහි ඇති බරපතල තත්වය නම් පළමු වරට රෝගය වැළඳුන කෙනෙකුට දෙවැනි වරට රෝගය වැළඳීමේදී හා රෝගය උත්සන්න වීමේ අවදානම වැඩිවීමයි. එනම් එම රෝගීන් ඉතා ඉක්මණින් භයානක ඩෙංගු රක්තපාත තත්ත්වයට පත්වීමට ඇති හැකියාව වැඩිවීමය.

ඩෙංගු වෛරසය පතුරුවන වාහක මදුරුවන් වන *Aedis aegypti, Aedis albopictus* යන මදුරු වර්ග දෙකම සර්ම කලාපීය රටවල සුලභව හමුවේ. මෙම මදුරුවන් බෝවීමට උචිත දේශගුණ තත්ත්වයන් මෙම රටවල පැවතීම මීට හේතුවයි.





**ඩෙංගු වෛරසය පුද්ගලයෙකුට ආසාදනය වන අයුරු**

ඩෙංගු මදුරුවන් වසර පුරා බිත්තර මගින් බෝවීම සිදුවන අතර, මදුරුවාගේ පැවැත්ම සඳහා මනුෂ්‍ය ලේ උරාබීම අත්‍යවශ වේ. (බිත්තර මේරීම සඳහා මිනිස් රුධිරය අවශ්‍ය වේ). ඩෙංගු රෝගය එක් පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයකුට පැතිර යන්නේ අසාදිත (වෛරසය ශරීර ගතවූ) Aedis වර්ගයට අයත් මදුරුවකු දෂ්ඨ කිරීම මගින්ය. Aedis මදුරු විශේෂයේ ගැහැණු මදුරුවා පමණක් රෝගය මිනිසුන් අතර පතුරවයි. මදුරුවා වැඩි වශයෙන් දෂ්ඨනයේ යෙදෙන්නේ උදෑසන 6 සිට 10 දක්වාත් සවස 3 සිට 6 දක්වාත් අතර කාලසීමාවේදීය. සිය පැවැත්ම උදෙසා මදුරුවා කිහිපවිටක් දෂ්ඨනයේ යෙදේ.

ඩෙංගු රෝගය දැනට දශක කිහිපයක සිට ශ්‍රී ලංකාව තුල ව්‍යාප්ත වෙමින් පවතින අතර පසුගිය වසර කිහිපය තුල මෙම නැඹුරුව වැඩිවෙමින් පවතී. මෙහිදී, පරිශ්‍ර අනුව සලකා බැලීමේදී මදුරුවන් සහිත ස්ථාන සහ මදුරුවන් බෝවිය හැකි ස්ථාන අතරින් පසුගිය වර්ෂ කිහිපය තුල පාසල් ප්‍රමුඛ ස්ථානයක පසුවේ. එමෙන්ම පාසල් තුල සිදුකරන ලද කීට විද්‍යා සමීක්ෂණ අනුව, තාවකාලිකව භාවිත නොකර ඉවත්කර ඇති ද්‍රව්‍ය, ඉවතලන ද්‍රව්‍ය සහ ක්‍රියා නොකරන හා භාවිතා නොකරන වැසිකිළි මදුරුවන් බෝවන ස්ථාන අතරින් ඉදිරියෙන්ම සිටී. තවද, සෑම වසරකම වාර්තාවන ඩෙංගු රෝගීන් අතරින් 30% කට ආසන්න ප්‍රමාණයක් පාසල් යන වයසේ දරුවන් වන බව වාර්තා වේ.

# ඩෙංගු රෝග ලක්ෂණ

ඩෙංගු වෛරසය ශරීරගත වූ පුද්ගලයන් ඩෙංගු ආසාදිතයන් ලෙස හැඳින්වේ. මෙවැනි ආසාදිතයන් සියල්ලක්ම ඩෙංගු රෝග ලක්ෂණ නොපෙන්වයි. ආසාදිතයන්ගෙන් 75% ක්පමණ ම රෝග ලක්ෂණ නොපෙන්වන අතර 25%ක් පමණක් රෝග ලක්ෂණ පෙන්වයි. මෙය ඩෙංගු රෝගයේ ආවේණික ලක්ෂණයක්වේ. රෝග ලක්ෂණ පෙන්නුම් කරන කොටසෙන් වැඩි පිරිසක්, එනම් 80%ක්ම පෙන්නුම් කරන්නේ ඩෙංගු උණ තත්ත්වයයි. 20% ක් වැනි සුළු පිරිසක් පමණක් ඩෙංගු රක්තපාත උණතත්ත්වය පෙන්නුම් කරයි.




ඒ අනුව යම් ප්‍රදේශයක් තුලවාර්ථා වන ඩෙංගු රෝගීන් ප්‍රාමාණයට වඩා වැඩි ප්‍රමාණයක් වෛරසය ශරීරගත වූ එහෙත් රෝග ලක්ෂණ නොපෙන්වන පුද්ගලයින් සිටිය හැකිය. එහි වැදගත්කම වන්නේ මේ සියලු දෙනාම ආසාදිත පුද්ගලයින් වීමයි.

දින 02* 07 දක්වා වූ තද උණ සමග, පහත සඳහන් රෝග ලක්ෂණ වලින් අවම වශයෙන් දෙකක් හෝ පවතී නම් ඩෙංගු රෝගය වැළඳී ඇති බවට සැක කළ යුතුය

- හිස රදය හා ඇස් යට වේදනාව
- මස් පිඩු හා සන්ධි වේදනාව
- ඔක්කාරය හා වමනය

- සමෙහි රතු ලප හට ගැනීම හා රුධිර වහන තත්ත්වයන්
- ඩෙංගු බහුල ප්‍රදේශයක වාසය කිරීමද ප්‍රධාන සාධකයක් වේ

## ඩෙංගු රක්තපාත උණ

ඩෙංගු රක්තපාත උණ, ඩෙංගු රෝගී තත්ත්වයකදී ඇතිවිය හැකි ප්‍රධානතම අවදානම්අවස්ථාවකි. මෙහිදී උණ බැස යාමත් සමග රුධිරවාහිනී තුළ ඇති ප්ලස්මා තරලය පිටතට කාන්දුවීම සිදුවේ (උරස් කුහරයට හා උදරකුහරයට). මෙය සාමාන්‍යයෙන් උණ සෑදී 3 වන දිනයේ සිට සිදුවන අතර, සම්පූර්ණරුධිර පරීක්ෂා (FBC) වලසිදුවුනු වෙනස්කම් මගින් හඳුනා ගත හැකිය. නොදැනුවත්කමින් දිගටම ප්ලස්මාවකාන්දුවීම නිසා රෝගියා කම්පන අවස්ථාවට පත්වීමෙන් මරණය පවා සිදුවිය හැකිය.

එබැවින් මෙවැනි රෝගීන් කලින් හඳුනාගෙන රෝහල් ගතකර ප්‍රතිකාර ලබාදිය යුතුවේ. කාන්දුවන ප්ලාස්මාව අනුරූප වන අයුරින් දියර බීමට හා ශිරා මගින් ලබා නොදුනහොත් රුධිර පරිමාව අඩුවී කම්පන තත්ත්වය ඇතිවී අක්මාව, මොළය, වකුගඩු, හෘදය වැනි අවයව වල ක්‍රියාකාරීත්වය ඇණහිටීමෙන් මරණය සිදුවිය හැකිය.

කම්පන අවස්ථාවට පත්වීමට පෙර ඇතැම් ඩෙංගු රෝගීන්උණ සෑදී දින 3 * 7අතරදී පහත සඳහන් ණීඅවදානම් ලක්ෂණ□ පෙන්නුම් කරයි.

## අවදානම්ලක්ෂණ

- උදරයේ ඇතිවන තද වේදනාව
- නොනවත්වා වමනය කිරීම
- අධික නිදිමත බව/ නොසන්සුන් බව/ අප්‍රාණික බව/ කරකැවිල්ල හා ක්ලාන්තය
- රුධිර වහනය වීම (විදුරුමසෙන් හා නාසයෙන්, තද දුඹුරු පැහැ වමනය සහ කළු පැහැති මළ පහවීම, මුත්‍රා සමග ලේ පිටවීම, අසාමාන්‍ය ලෙස යෝනි මාර්ගයෙන් ලේ පිටවීම).
- පැය 6 කට වඩා වැඩි කාලයක් මුත්‍රා පහ නොවීම හෝ පිටවන මුත්‍රා ප්‍රමාණය අඩුවීම

මෙම අවදානම් රෝග ලක්ෂණ ඇත්නම් රෝගියා කම්පන අවස්ථාවට පත්විය හැකි බැවින්, වහාම රෝහලක් වෙත ගොස් වෛද්‍ය උපදෙස් ලබාගන්නා ලෙස දැනුම් දිය යුතුය.

# පාසල තුල ඩෙංගු මර්දනය සඳහා ඔබගෙන් ඉටුවිය යුතු කාර්යභාරය

ගුරුවරුන් විසින් මදුරු මර්දන ක්‍රියාකාරකම් කෙරෙහි දරුවන් නිවැරදිව යොමු කිරීම සහ දිරිගැන්වීම අත්‍යාවශ වේ. මේ සඳහා පහත ක්‍රමවේදය අනුගමනය කිරීම තුලින් දරුවාගේ ධනාත්මක හා චර්යාත්මක වෙනසක් ඇතිවීම අපේක්ෂා කල හැක.

| ප්‍රාථමික අධ්‍යාපනය | → | ද්විතීයික අධ්‍යාපනය | → | අ.පො.ස සා/පෙළ |
|---|---|---|---|---|
| ඩෙංගු මදුරුවන් ගෙන් තොර පරිසරයක් සඳහා චර්යාත්මක වෙනසක් ඇතිකිරීම | | ඩෙංගු රෝගය පිළිබඳ දැනුවත් කිරීම සහ සවිබල ගැන්වීම | | ඩෙංගු රෝගය පිළිබඳ විෂයානුබද්ධ දැනුම ඇගයීම |

ඉහත ක්‍රමවේදයට අනුකූලව පාසල තුල මේ වනවිටත් හඳුන්වාදී ඇති මදුරු මර්දන කටයුතු ශක්තිමත් කිරීම හා නව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත්ය. දැනට පාසල් තුල ක්‍රියාත්මක වන වැඩසටහන් ශක්තිමත් කිරීම පිණිස පහත ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකිය.

## ඩෙංගු මර්දනය සඳහා නිතිපතා සිදු කළයුතු පිරිසිදු කිරීම් කටයුතු

- පාසල් හා සියලුම අධ්‍යාපනික ආයතන තුල ඩෙංගු මර්දන කමිටු ස්ථාපිත කිරීම, පවත්නා සහ අලුතින් ස්ථාපිත කමිටු බලගැන්වීම.
- පාසලේ මදුරුවන් බෝවන ස්ථාන පරීක්ෂාකර විනාශ කිරීම සඳහා සතිපතා පැයක කාලයක් වෙන්කිරීම. (පෙ.ව 11 සිට දහවල් 12 දක්වා)
- පාසල් පරිසරය කලාපවලට බෙදා වෙන්කර අදාල පන්තිවලට වගකීම බාරදීම.
- සතිපතා කාලසටහන තුල යොදාගත් පැයක කාලයකදී කලාප සියල්ල පරීක්ෂාකර මදුරුවන් බෝවන ස්ථාන විනාශ කිරීම.

# පාසල තුල ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන













- සෑම සතියකට වරක් ම දෙමාපියන් විසින් මදුරුවන් බෝවන ස්ථාන පරීක්ෂාකර විනාශ කිරීම. මේ සඳහා දෙමාපියන්ට සෘජුවම සහභාගි විය නොහැකි අවස්ථාවලදී ඒ සඳහා යම් විකල්ප ක්‍රියාමාර්ගයක් යොදාගත හැක.
- සෑම පාසල් නිවාඩු කාලයක් අවසානයේ දීම සහ පාසල පටන් ගැනීමට පෙර දෙමව්පියන් හා පාසල් සිසුන් එක්වී පාසල් පරිශ්‍රය තුල හා ඒ අවට ඇති මදුරුවන් බෝවන ස්ථාන පිරිසිදු කිරීම.
- සෑම ප්‍රධාන විභාගයකටම ප්‍රථම, පාසල අයත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සහයෝගය ඇතිව පාසල තුල පරිශ්‍ර පරීක්ෂා සහ ධූමායන කටයුතු සිදුකිරීම.
- ඩෙංගු මර්දන කමිටුව මගින් පාසල් තුල මදුරුවන් බෝවියහැකි ස්ථාන පිළිබඳව නිතිපතා අධීක්ෂණය කර කලාප අනුව සතිපතා ක්ෂේත්‍ර සමීක්ෂණ පත්‍ර වාර්තා (ඇමිණුම 1) විදුහල්පති වෙත ලබාදීම.
- විදුහල්පති සහ ඉහළ නිලධාරීන් එම ගැටළු සහිත ස්ථාන පරීක්ෂා කර ඒවා නිරාකරණය කිරීමට කටයුතු කිරීම.
- සෑම මසකටම වරක් අදාල පාසලේ විදුහල්පතිතුමා/විදුහල්පතිතුමිය විසින් මදුරුවන් බෝවීමේ ප්‍රවණතාවය පිළිබඳ වාර්තාවක් (ඇමුණුම 2) කලාප අධ්‍යක්ෂක සහ අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත ලබාදීම.
- ඒ සියළු වාර්තා ගොනුගතකර තැබීම.

## පාසල් දරුවන් අතර උණ රෝග (ඩෙංගු ඇතුළුව) තත්වයන් දැනුම්දීම

- යම් ශිෂ්‍යයකුට ඩෙංගු උණ රෝගය වැළඳී ඇත්නම් ඒ පිළිබඳව වහාම අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත දැනුම්දීම.
- උණ රෝගයෙන් පෙලෙන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් පිළිබඳ තොරතුරු “Dengue Free Child App” නැමති මෘදුකාංගය භාවිතයෙන් ජාතික ඩෙංගු මර්දන ඒකකය වෙත දැනුම්දීම සහ ඒ සඳහා ක්‍රියාත්මක වීමට දෙමාපියන්ද දැනුවත්කිරීම. රෝගීන් පිළිබඳ දත්ත මෘදුකාංගයට එක්කිරීම පාසල් ගුරුවරුන්ට සහ දෙමව්පියන්ට සිදුකල හැක. මේ සඳහා “Play Store” හෝ Internet Browser හරහා Android වර්ගයේ දුරකතන වලට මෘදුකාංගය බාගත කිරීම සිදුකල යුතුය. (https://play.google.com/store/apps/details?id=com.mobitel.dengue.school&hl=en) මෙමගින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හරහා ක්ෂේත්‍ර මදුරු මර්දන ක්‍රියාකාරකම් වඩාත්



කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීමට හැකිවන අතර ඩෙංගු වසංගත තත්ත්වයන් කලින් හඳුනාගෙන වළක්වා ගැනීමට හැකියාව ලැබේ.

- ඩෙංගු වැළඳුන පාසල් දරුවන් ගේ විස්තර ඇතුලත් ලේඛනයක් කාර්යාලයේ පවත්වා ගැනීම. මෙම ලේඛනයට ඇතුලත් කිරීම සඳහා පන්ති භාර ගුරුවරුන් විසින් තම පන්තියේ ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට අදාල නිවැරදි තොරතුරු ලබාදීම වැදගත් වේ. මෙහි දරුවාගේ නම, පන්තිය, රෝගය වැළඳුන දිනය, රෝගය වැළඳීමට පෙර සති දෙකක කාලයක් තුල දරුවා කාලය ගතකළ ප්‍රදේශය සහ එම ප්‍රදේශය අයත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.









## කසළ කළමනාකරණය සඳහා ක්‍රමවේදයක් සැකසීම

- සියලුම සිසුන් පාසල තුල කසල ජනනය වීම අවම කිරීම (Reduce), නැවත භාවිතය (Reuse) සහ ප්‍රතිචක්‍රීකරනය (Recycle) පිළිබඳව දැනුවත් කිරීම සහ ප්‍රයෝගිකව එය ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම (3R සංකල්පය).
- වර්ගීකරණය කළ කසල බැහැරලීම සඳහා පාසල තුල ස්ථානයක් ස්ථාපිත කිරීම.

- ආපනශාලා සහ නේවාසිකාගාරවලින් බැහැරලන ද්‍රව්‍ය වර්ගීකරණය අනිවාර්යය කිරීම සහ සුරක්ෂිතව බැහැරලීම හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීම.
- නිතිපතා පාසලින් කසල ඉවත්කිරීමට යාන්ත්‍රණයක් සැකසීම. මේ සඳහා පළාත් පාලන ආයතනය සහ ප්‍රදේශයේ කසල ප්‍රතිචක්‍රීකරණය කරන ආයතන සමග එක්ව කටයුතු කිරීම.
- දිරායන කසල ප්‍රතිචක්‍රීකරණය සඳහා පාසල තුල ජීවකොටු නිර්මාණය කිරීම.
- පොලිතීන් පාසලට ගෙන ඒම වැළැක්වීම “No polythene” policy.
- කසළ අවම කිරීම සඳහා නැවත භාවිත කළහැකි භාජන සහ ඇසුරුම් ආදිය භාවිතය වැඩි කිරීම. උදා: පාසලට ආහාර ගෙන එම සඳහා නැවත භාවිත කළහැකි භාජනයක් භාවිතය.
- ආපනශාලා සහ නේවාසිකාගාරවලින් පිටවන අපජලය නිසියාකාරව බැහැරලීම.
- කසළ වර්ගීකරණය නිසියාකාරව සිදුවේද යන්න අධීක්ෂණය කිරීම සඳහා කමිටුවක් පත්කර ඒ පිළිබඳ වාර්තාවන් තබා ගැනීම.

## පාසල තුල ඇති වැසිකිළි සම්බන්ධව කටයුතු කළයුතු ආකාරය

- කැඩී ඇති වැසිකිළි සහ ගලි පද්ධතිවලට අවශ්‍ය පරිදි තාවකාලික කීටනාශක යෙදීම.
- එම කැඩී ඇති කොටස් ඉක්මනින් පිළිසකර කර නැවත භාවිතයට ගැනීම.
- වැසිකිළි දීර්ඝ කාලයක් වසා තැබීමෙන් වැළකීම.

## පාසල තුල ඇති ඉදිකිරීම් පරිශ්‍ර සම්බන්ධව කටයුතු කළයුතු ආකාරය

- පාසල තුල ඇති ඉදිකිරීම් පරිශ්‍ර පවතීනම් එය කඩිනමින් අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයට පාසලේ විදුහල්පති හෝ වගකිවයුතු නිලධාරියෙකු මගින් දැනුම්දිය යුතුය.
- ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන වලින් තොරව පවත්වාගෙන යෑම සඳහා නිසි ක්‍රමවේදයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කර්යාලය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කලයුතුය.

# පාසල් පරිසරය පිරිසිදුව තබා ගනිමු













## ඩෙංගු රෝගය සම්බන්ධ සෞඛ්‍ය අධ්‍යාපනය සහ අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා සෞඛ්‍ය අංශයේ සහයෝගය ලබා ගැනීම

ඉහත සඳහන් කරන ලද ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය වන තාක්ෂණික තොරතුරු සහ සම්පත් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිලධාරීන් හරහා ලබාගත හැක.

පාසල අයත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හරහා පාසල තුල ඩෙංගු රෝගය සම්බන්ධ නිරන්තර දැනුවත්කිරීම්

- කීටයන් බෝවන ස්ථාන පිළිබඳව ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධ උපදෙස්
- කීටනාශක ද්‍රව්‍ය
- කසල කළමනාකරණය පිළිබඳ උපදෙස්
- රෝගීන් පිළිබඳව දැනුම්දීම සඳහා “Dengue Free Child App” නමින් ඇති මෘදුකාංගය භාවිතය සම්බන්ධයෙන් උපදෙස්
- තොරතුරු පත්‍රිකා සහ අනෙකුත් අදාල දැනුවත්කිරීම් හා දේශන

ඉහත සඳහන් කරුණු වලට අමතරව ශරීරයේ බාහිරට නිරාවරණය වූ ප්‍රදේශ සඳහා අනුමත මදුරු විකර්ෂක භාවිත කල හැකි අතර ඒ සඳහා දරුවන් සහ දෙමාපියන් දැනුවත් කල හැක. (අනුමත මදුරු විකර්ශක සම්බන්ධයෙන් තොරතුරු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් ලබා ගත හැක.) එමෙන්ම, පාසල තුල ඩෙංගු රෝග පාලනයට අදාලව සෞඛ්‍ය අංශය මගින් සිදුකරන කටයුතු වල වාර්තාවන් අඩංගු ලිපි ගොනුවක් පවත්වා ගැනීම වැදගත්ය. මෙහි සෞඛ්‍ය කාර්ය මණ්ඩලය මගින් පාසල තුල සිදුකළ පරිශ්‍ර පරීක්ෂා වාර්තා ආදිය අඩංගු වීම පසු විපරම් සඳහා අත්වැලකි.

අපගේ සාමූහික ක්‍රියාකාරීත්වය ඩෙංගු රෝගය වැලැක්වීම සඳහා ඇති හොඳම මාර්ගයයි.



ඇමිණුම 01

# පාසලේ නිරීක්ෂණ කලාප තුල මදුරුවන් බෝවන ස්ථාන පරීක්ෂා කිරීම සතිපතා වාර්තාව

පාසල : ............................................................. දිනය :......................................

පරීක්ෂා කළ කලාපය : ..........................................................................................

| අනු අංකය | පරීක්ෂා කල ප්‍රදේශය | මදුරුවන් බෝවිය හැක | කීටයන් සහිතයි | නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **ගොඩනැගිලි, බරාඳ සහ පඩිපෙළවල්** | | | |
| | බිම මත | | | |
| | ජලය එක් රැස් විය හැකි සඳලුතල | | | |
| | ජලය නොබසින කානු සහ ගලි වළවල් | | | |
| | විදුලි සෝපාන සහ සෝපාන වල | | | |
| | මල් බඳුන් සහ තැටි | | | |
| | ශීතකරණ/ වායු සමීකරණ තැටි | | | |
| | ජල බේසම් සහ ඒ ආශ්‍රිත ජලය රැස්කරන භාජන | | | |
| | ජලය රැඳිය හැකි ඉවතලන භාජන සහ අයිතමයන් | | | |
| 2 | **වැසිකිළි පද්ධති පරිශ්‍රය** | | | |
| | භාවිත නොකරන වැසිකිළි සහ සිස්ටන | | | |
| | කැඩී ඇති වැසිකිළි සහ සිස්ටන | | | |
| | ජල බේසම් වල ගලි වළවල් සහ කාණු පද්ධතිය | | | |

| | | | | |
|---|---|---|---|---|
| | ජලය රැස් කරන බඳුන් | | | |
| **3** | **ජල ටැංකි සහ වැහි පිහිලි** | | | |
| | කොන්ක්‍රීට් වහල මත | | | |
| | ජල ටැංකිය යට බිම | | | |
| | ජල ටැංකිය තුල | | | |
| | වැහි පිහිලි | | | |
| | ජලය රැඳිය හැකි ඉවතලන භාජන සහ අයිතමයන් | | | |
| **4** | **ගොඩනැගිලි ආශ්‍රිත භූමිය** | | | |
| | ජලය නොබසින කානු සහ ගලි වලවල් | | | |
| | ජලය බැසීම අවහිර වූ මල් බඳුන් සහ තැටි | | | |
| | පොකුණු සහ පක්ෂි තටාක | | | |
| | ගස්බෙන/ බ්‍රෝමිලියා ශාකා | | | |
| | ටයර් | | | |
| | භාවිතා නොකරන වැසිකිලි උපාංග සහ ටැංකි | | | |
| | ජලය රැස්විය හැකි භාජන | | | |
| | කැන්වස් / පොලිතින්/ ෂොපින් කවර | | | |
| | පස මත ජලය රැඳිය හැකි වලවල් | | | |
| | කසළ එකතුකරන භාජන | | | |
| | යකඩ පුවරු මත ඇති දාර | | | |
| | ජලය රැඳිය හැකි ඉවතලන භාජන සහ අයිතමයන් | | | |

| | | | | |
|---|---|---|---|---|
| **5** | **ආපන ශාලාව /නේවාසිකාගාරය** | | | |
| | කෑම පිසින භාජන | | | |
| | ජලය එක්රැස්කරන භාජන | | | |
| | ශීතකරණ/ වායු සමීකරණ තැටි | | | |
| | කසළ එකතුකරන භාජන | | | |
| | ජල බේසම් යට බිම | | | |
| | පිඟන් සහ සේදූ භාජන තබන රාක්ක යට ඇති තැටි | | | |
| **6** | **වෙනත්** | | | |

ප්ලාස්ටික් කෝප්ප, යෝගට් කෝප්ප, පොල් කටු, කිරිහට්ටි, බෝතල්, සෙල්ලම් බඩු කොටස්, පිඟන් කැබලි, ටින්, ලී පෙට්ටි, ඉවතලන පොලිතින් සීට්, ප්ලාස්ටික් දවටන, පොලිස්ටයිරීන් ද්‍රව්‍ය, බියර් කෑන්, ඉවත් කල උළුකැට, කැඩුණු ගොඩනැගිලි අයිතම, අබලි ද්‍රව්‍ය, භූගත බට, ඇන්ටෙනා බට, මුනින් නමා ඇති බකට් වල දාර

වෙනත් කරුණු :

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

කලාප භාරකරුගේ නම සහ තනතුර:

.......................................................................................................................

.......................................................................................................................

කලාප භාරකරුගේ අත්සන :

.......................................................................................................................

ඇමිණුම 02

# පාසල් පරිශ්‍රය තුල මදුරුවන් බෝවන ස්ථාන පරීක්ෂා කිරීමේ මාසික වාර්තාව 2019

මෙම මාසික වාර්තාව, පාසල තුල නිරීක්ෂණ කලාප සතිපතා වාර්තා සම්පිණ්ඩනය කර සෑම මසකම 10 වැනිදාට පෙර සකස් කර අදාළ කලාප අධ්‍යාපන කාර්යාලය වෙත ද, එහි පිටපතක් අයත් වන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙතද ලබා දීමට කටයුතු කරන්න. අදාළ වාර්තාවන් වල පිටපත් සහිත පාසල් ලිපිගොනුවක් ද පවත්වා ගන්න.

සෞ. වෛ.නි. කොට්ඨාශය: ......................................................................................

ම.සෞ.ප. කොට්ඨාශය: ..........................................................................................

පාසල : ..............................................................................................................

දිනය : ...............................................................................................................

| පරීක්ෂා කල ප්‍රදේශය | පළමු සතිය | | දෙවන සතිය | | තෙවන සතිය | | සිව්වන සතිය | |
|---|---|---|---|---|---|---|---|---|
| | ජලය එකතු වියහැකි ස්ථාන | මදුරු කීටයන් සහිත ස්ථාන | ජලය එකතු වියහැකි ස්ථාන | මදුරු කීටයන් සහිත ස්ථාන | ජලය එකතු වියහැකි ස්ථාන | මදුරු කීටයන් සහිත ස්ථාන | ජලය එකතු වියහැකි ස්ථාන | මදුරු කීටයන් සහිත ස්ථාන |
| 1. ගොඩනැගිලි, බරාද සහ පඩිපෙළවල් | | | | | | | | |
| 2. වැසිකිළි පද්ධති පරිශ්‍රය | | | | | | | | |
| 3. ජල ටැංකි සහ වැහි පිහිලි | | | | | | | | |
| 4. ගොඩනැගිලි ආශ්‍රිත භූමිය | | | | | | | | |
| 5. ආපන ශාලාව සහ නේවාසිකාගාර | | | | | | | | |
| 6. වෙනත් | | | | | | | | |

ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ වෙනත් කරුණු :

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

විදුහල්පතිගේ නම : ..............................................................................................

විදුහල්පතිගේ අත්සන : ..........................................................................................

# සටහන්